OL/TH/N/S/669

රහස්‍ය ලේඛනයකි.


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2016

11 - බුද්ධ ධර්මය

(නව නිර්දේශය)

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සපයා තිබේ.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

Scanned with CamScanner

උත්තරපත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමින්** ලියන්න.
- ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය)

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරු ව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අදින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර × ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා : $\left(\frac{60}{100}\right)$ $\left(\frac{20}{30}\right)$

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර

- අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස් ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්නපත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්නපත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්නපත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතු ය.

Scanned with CamScanner

උදාහරණ : මුළු ලකුණු 100

අවසාන ලකුණු 100	මුළු ලකුණු 100	I පත්‍රය 40	II පත්‍රය 60
44	44	AB	44

අවසාන ලකුණු 100	මුළු ලකුණු 200	I පත්‍රය 100	II පත්‍රය 100
31	62	62	AB

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා

- කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටුවලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  (උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)

- කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකැට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

- කිසියම් අයදුම්කරුවකුගේ උත්තරපත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

- කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

මෙවැනි අවස්ථාවල දී

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තරපත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳ ව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

ප්‍රශ්න අංක 03 - (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

Scanned with CamScanner

සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියල්ල ම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාළ සියලු ම උත්තරපත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තරපත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :

(අ)	(ආ)	(ඉ)
(i) $\frac{54}{100}$	(i) $\frac{22}{40}$	(i) $\frac{60.5}{100}$
(ii) $\frac{67}{100}$	(i) $\frac{34}{60}$	(i) $\frac{81}{100}$
(iii) $\frac{36}{100}$		
$3 \overline{)157}$		$2 \overline{)141.5}$
52.33		70.75
52%	56%	71%

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතු ය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතු ය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2016

11 - බුද්ධ ධර්මය

සවිස්තර ලකුණු දීමේ පරිපාටිය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවේ දැක්වෙන පරිදි ජාතික අධ්‍යාපන පද්ධතිය මඟින් ඉටුකරගත යුතු ජාතික පොදු අරමුණු 08 වේ. එසේම මූලික නිපුණතා 07 ක් දැක්වේ. විධිමත් අධ්‍යාපනය මඟින් මෙකී අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. මූලික නිපුණතා අතර පස් වැන්න ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව වේ. එය පහත දැක්වේ.

"5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය."

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක සමස්ත විෂයමාලාව තුළින් පොදු අරමුණු හා මූලික නිපුණතා ඉටුකරගත යුතු අතර, ආගමික අධ්‍යාපනය තුළින් ඉහත දැක්වෙන පස්වන නිපුණතා සුවිශේෂීව සපුරාගත යුතුව පවතී.

බුද්ධ ධර්මය විෂය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම වර්තමාන යුගයට අත්‍යවශ්‍යව පවතී. වනපොත්කරණයෙන් විෂය කරුණු හදාරා විභාග සමත්වීම එකම අරමුණ නොවිය යුතු අතර, ඉන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත් දහම් කරුණු භාවිතයට ගැනීමටත්, බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු අනුව තම ජීවිතය සාර්ථක කරගැනීමටත් සිසුන් යොමු කරලීම අත්‍යවශ්‍ය වේ. සමබර පෞරුෂයකින් හෙබි සැදැහැති බෞද්ධයකු දැයට දායාද කිරීම බුදු දහම ඉගැන්වීමේ මූලික අරමුණු විය යුතුය. බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරයා මේ පිළිබඳ සුවිශේෂීව අවධානය යොමු කළ යුතුවේ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ සැකසුන විෂයමාලාවක් පාසල් පද්ධතියට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව බුද්ධ ධර්මය විෂයයේ අරමුණු 07 ක් දැක්වේ. මෙම අරමුණු සපුරාලන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගත යුතුවේ. එම විෂය අරමුණු මෙසේයි.

විෂයයේ අරමුණු

01. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදිව ප්‍රායෝගික වතාවන්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

02. ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගී කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

03. සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චර්තය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

04. ශ්‍රී ලාංකීය උරුමය දයාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

05. සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චර්තායනයට මග පෙන්වීම.

06. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

07. බෞද්ධ ශික්ෂාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

Scanned with CamScanner

එසේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් ද්විතීයික විෂය නිර්දේශය මූලික නිපුණතා 10 ක් යටතේ ගොනු කර ඇත. 6 ශ්‍රේණියේ සිට නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය ක්‍රමයෙන් ගැඹුරින් හා පළලින් වැඩිවන ලෙස සර්පිලාකාර ක්‍රමයට ව්‍යාප්ත වන ලෙස සැකසී ඇත. බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා 10 පහත දැක්වේ.

බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා

01). තෙරුවන ගුණ හැඳින චර්තායනය කරයි..

02). ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.

03). බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

04). සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

05). ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

06). බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

07). ජීවී, අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.

08). ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

09). බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

10). නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

ඉහත දැක්වූ විෂය අරමුණු 07 පෙරදැරි කරගෙන නිපුණතා 10 සම්පූර්ණ වන ලෙස විෂය ඉගැන්වීම සාර්ථකව සිදු කළේ නම් සිසුන් තුළ යහපත් ගුණවගාවන් සිදුවනු ඇත. මෙම අවශ්‍යතාවන් ඉටුවන ලෙස ප්‍රායෝගිකත්වයට නැඹුරුව තක්සේරුකරණය පාසල් පාදකව සිදුවිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගය යනු විෂය දැනුම පිළිබඳ සමාප්තික ඇගයීම වේ.

බුද්ධ ධර්මය විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම ප්‍රශ්න පත්‍ර සැකසී ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් යොමු කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිතය. නිපුණතාවක් (Competency) යනු දැනුම (Knowledge) ආකල්ප (Attitude) කුසලතා (Skills) සහ යහ පුරුදු (Good Practices) යන මේවායේ සමස්ත එකතුවේ ප්‍රතිඵලය වෙයි. දිගුකාලීනව ලැබූ ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන ඵලය නිපුණතාවයන්ගෙන් පිරි සමබර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් වේ. බුද්ධ ධර්මය විෂයය න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව හැදෑරීම තුළින් ආගම විෂයයට අදාළ නිපුණතා ශිෂ්‍යයා සපුරා ගෙන ඇත යනු අපගේ විශ්වාසයයි. ඇගයීම් ක්‍රියාවලිය ද නිපුණතා පාදකව සිදුකරලීම සඳහා ප්‍රයත්න දරා ඇත. අදාළ නිපුණතාව ශිෂ්‍යයා අත් කර ගෙන තිබේද යන්න මැන බැලීමට උචිත අයුරින් බොහොමයක් වණු සැකසී ඇති බව සිහියේ තබාගත යුතුය.

මෙම විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. පළමුවැන්න බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. දෙවැන්න කෙටි පිළිතුරු සැපයීමේ හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න වලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු වෙන් කොට ඇත්තේ මතු දැක්වෙන පරිදි වේ.

I - පත්‍රය ලකුණු 40 යි

II - පත්‍රය ලකුණු 60 යි

මුළු ලකුණු 100 යි

Scanned with CamScanner

බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු දැනුම පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ දැනුම, අකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨ්‍යග්‍රන්ථ මගින් විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මගින් පෝෂණය කිරීම අපේක්ෂිතය බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමගින් හුදු දැනුම පමණක් මණිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ දැනුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතලිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක් දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතලිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහත සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

ii. සිදුරුපත් භාවිතා කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

iii. සිදුරුපත් මගින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

Scanned with CamScanner

බුද්ධ ධර්මය II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදු වලින් යුක්ත වෙයි. නිපුණතාවයක් දිගුකාලීනව ඇතිවන්කි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාවද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතාද විමසා බැලීමේ මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේ දී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. 02 සිට 06 දක්වා ප්‍රශ්නවල

i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. 7 වන ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 බැගින් කොටස් දෙකට ලකුණු (5 x 2) 10 කි. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේෂයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දැක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාගෙ නම් කිරීමක්, අර්ථ දැක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීමට සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍රහ කොට ඇති අයුරු අපේක්ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුසට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂවට ලක් කරනු ලැබේ.

Scanned with CamScanner

මෙම කොටස් තුනෙන් iii කොටසට සපයා ඇති පිළිතුරු බොහෝවිට ගැඹුරු නොවීමට පුළුවන. එහෙත් අසා ඇති ප්‍රශ්න නිවැරදිව වටහා ගෙන අර්ථවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් පිළිතුර කෙටි වුවද සාධාරණ ලකුණු ප්‍රමාණයක් දීම සුදුසුය.

7 වන ප්‍රශ්නයේ මාතෘකා දෙකකට කෙටි සටහන් ලිවීම අපේක්ෂා කෙරේ.

04. ශිෂ්‍යයා නිවහල් චින්තනයට යොමු කිරීම නූතන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකනු ලැබේ. එබැවින් බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී අදාළ පාඨ ග්‍රන්ථයනහි අන්තර්ගතයටම වහල් නොවී ස්වාධීනව ඉදිරිපත් කර ඇති නිවැරදි කරුණු පිළිබඳ ඔබේ අවධානය යොමු කිරීම මැනවි.

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2016

II - බුද්ධ ධර්මය
අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය : බහුවරණ ප්‍රශ්න 40 කි = (40 x 1) ලකුණු 40 යි

II පත්‍රය: 1 වැනි ප්‍රශ්නය කොටස් 10 කි කෙටි පිළිතුරු (10 x 2) ලකුණු 20 යි

2 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

3 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

4 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

5 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

6 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

7 වැනි ප්‍රශ්නය එක් කොටසකට ලකුණු 5 බැගින්

(ලකුණු 5 X 2) ලකුණු 10 යි.

ලකුණු 60 යි.
මුළු ලකුණු 100 යි.

පළමු සහ දෙවන පත්‍රවල ලකුණු දැමීම
පළමු පත්‍රයේ සිදුරුපත් මගින් වැරදි ලකුණු කිරීමේ දී අදාළ ප්‍රශ්න අංකය ඉදිරියේ හරි වැරදි ලකුණු කරන්න.
නිවැරදි ලකුණු ගණනය කොට අදාළ පේළිය යට කොටුවෙහි මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

දෙවන පත්‍රයේ කොටස් ලකුණු දකුණු පස ඇති තීරුවේ ලියා දක්වන්න.
එක් එක් ප්‍රශ්නයේ කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න

උදා : i. $\frac{2}{2}$ ii. $\frac{2}{3}$ iii. $\frac{2}{5}$ = $\frac{06}{10}$

Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි] முழுப் பதிப்புரிமையுடையது]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW | 11 | S | I, II

இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර்
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

බුද්ධ ධර්මය I

සැලකිය යුතුයි :

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු කළ ප්‍රථම උදාන වාක්‍යය වන්නේ,
(1) "අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස" යන්නයි.
(2) "සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා" යන්නයි.
(3) "උත්තිට්ඨේ නප්පමජ්ජෙය්‍ය - ධම්මං සුචරිතං චරේ" යන්නයි.
(4) "අනේකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං" යන්නයි.

2. "බමුණ, මම දෙවියෙක්, ගාන්ධර්වයෙක්, යක්ෂයෙක්, මනුෂ්‍යයෙක්, නොවෙමි. මම බුද්ධ නම් වෙමි." බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ,
(1) හුහුංක බමුණාට ය.
(2) ද්‍රෝණ බමුණාට ය.
(3) ජානුස්සෝණි බමුණාට ය.
(4) සොත්ථිය බමුණාට ය.

3. සිදුහත් බෝසතුන්ගේ ශාන්තබව හා රූපශ්‍රිය දැක "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති." යනාදි වශයෙන් ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) කිසාගෝතමිය විසිනි.
(2) භද්දකච්චානා විසිනි.
(3) රූප නන්දා විසිනි.
(4) උප්පලවන්නා විසිනි.

4. සුනීත, සෝපාක වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති,
(1) යථාවාදී තථාකාරී ගුණයයි.
(2) පුරිසදම්ම සාරථී ගුණයයි.
(3) අසරණ සරණ ගුණයයි.
(4) ගිලනුන්ට උවැටන් කිරීමේ ගුණයයි.

5. සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද, රහසින්වත් පව් නො කළ හෙයින් ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වන හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
(1) 'අරහං' නම් වන සේක.
(2) 'සුගතෝ' නම් වන සේක.
(3) 'බුද්ධෝ' නම් වන සේක.
(4) 'භගවා' නම් වන සේක.

6. බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය ප්‍රකට වන්නක් ලෙස 'නිබද්ධ චාරිකා' නම් කළ හැකි ය. නිබද්ධ චාරිකා යනු,
(1) නිතර ගමන්බිමන්වල යෙදීමයි.
(2) විශේෂ පුද්ගලයකු හෝ පිරිසක් අරභයා වැඩම කිරීමයි.
(3) රාජරාජ මහාමාත්‍යාදීන් හමුවීමයි.
(4) දිවා රාත්‍රී දෙකෙහි ම ධර්ම ප්‍රචාරයේ යෙදීමයි.

Scanned with CamScanner

7. බුදුබව පතන බෝසත් උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් සමූහය හැඳින්වෙන්නේ,
(1) දස රාජධර්ම නමිනි. (2) දස පින්කිරියවත් නමිනි.
(3) දස පාරමිතා නමිනි. (4) දස සක්විතිවත් නමිනි.

8. 'ආහාරෙ මත්තඤ්ඤුතා' හෙවත් 'පමණ දැන ආහාර අනුභවය' පිළිබඳ බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ලබාගත් රාජ්‍ය පාලකයා වන්නේ,
(1) උදේනි රජතුමා ය. (2) බිම්බිසාර රජතුමා ය.
(3) අජාසත් රජතුමා ය. (4) කොසොල් රජතුමා ය.

9. "යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය. පව් නොකළොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය." මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති" යන්නයි.
(2) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
(3) "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි.
(4) "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" යන්නයි.

10. සිතීමට හා විමසීමට පූර්ණ නිදහස ලබා දුන් බුදුරජාණන් වහන්සේ, යමක් ඇසූ පමණින්, පරම්පරාවෙන් ආ පමණින් ආදී වශයෙන් නොපිළිගත යුතු බව දේශනා කළහ. එම කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) කාලාම සූත්‍රයයි. (2) වීමංසක සූත්‍රයයි.
(3) අරියපරියේසන සූත්‍රයයි. (4) මහාපරිනිබ්බාන සූත්‍රයයි.

11. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ධනය විනාශ වීමට හේතු වන කරුණු අතරට අයත් **නො වන** කරුණක් වන්නේ පහත කවරක් ද?
(1) නුසුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම (2) නැටුම්, ගැයුම්, වැයුම් හි ලොල්බව
(3) පව්ටු මිතුරන් ඇසුරු කිරීම (4) අනලස්ව කාලය ගත කිරීම

12. 'චින්තාමය ප්‍රඥාව' යන්නෙන් හැඳින්වෙන්නේ,
(1) පොතපත කියවීමෙන් නුවණ දියුණු කර ගැනීමයි.
(2) ගුරුවරයාට සවන්දීමෙන් නුවණ දියුණු කර ගැනීමයි.
(3) භාවනාවෙන් නුවණ දියුණු කර ගැනීමයි.
(4) සිතීමෙන් නුවණ දියුණු කර ගැනීමයි.

13. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණයට ඇතුළත් **නො වන** කරුණක් වන්නේ,
(1) කීර්තිය පැතිරීමයි. (2) මිනැම පිරිසක් වෙත නිර්භයව යා හැකි වීමයි.
(3) සිහිමුළාවී කලුරිය කිරීමයි. (4) මරණින් මතු සුගතියෙහි උපත ලැබීමයි.

14. "භව පච්චයා ජාති" යන්නෙන් පැහැදිලි කරන්නේ,
(1) සත්ත්වයා නැවත සසරට එකතුවීම නිසා සසර ඉපදීම සිදු වීමයි.
(2) තණ්හාව නිසා නැවත භවයක ඉපදීමයි.
(3) ඉපදීම නිසා ජරා මරණාදියට පත්වීමයි.
(4) භවය නිසා නිමක් නැති දුක් අත් විඳීමයි.

15. "චතුරාර්ය සත්‍යය නොදැනීම හේතු කොට ගෙන කුසලාකුසල කර්ම රැස්කරයි." යන්න ප්‍රකාශ වන්නේ,
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" මගිනි. (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" මගිනි.
(3) "විඤ්ඤාණ පච්චයා නාම රූපං" මගිනි. (4) "තණ්හා පච්චයා උපාදානං" මගිනි.

16. තණ්හාව මුල්කොටගෙන සමාජයේ කලකෝලාහල ඇති වන බව සඳහන් සූත්‍ර දේශනාව කුමක් ද?
(1) සති පට්ඨාන සූත්‍රය (2) වසල සූත්‍රය (3) මහා නිදාන සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

17. ආහාරයෙහි පමණ දැන අනුභව කිරීම නිසා යහපත් ප්‍රතිඵල ලැබෙන බව භද්දාලි සූත්‍රයෙහි දැක් වේ. එහි සඳහන් යහපත් ප්‍රතිඵලයක් **නො වන්නේ** පහත කවරක් ද?
(1) රෝගාබාධ අඩුවීම (2) නිදුක් බව ලැබීම (3) කාය බලය ලැබීම (4) බුද්ධිමත් බව වැඩිවීම

Scanned with CamScanner

18. "ලාභෝ අලාභෝ අයසෝ යසෝව" යන ගාථාවෙන් දැක්වෙන්නේ,
(1) හේතුඵල ධර්ම පිළිබඳවයි. (2) සමානාත්මතා ධර්ම පිළිබඳවයි.
(3) ලෝකාධිපති ධර්ම පිළිබඳවයි. (4) අටලෝ දහම පිළිබඳවයි.

19. පරපණ නැසීම, සොරකම, වැරදි කාම සේවනය යන අකුසල් තුනෙන් වැළකීම අරි අටඟි මගෙහි,
(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි
(3) සම්මා කම්මන්තයයි. (4) සම්මා ආජීවයයි.

20. උත්සාහයෙන්, වීර්යයෙන්, දැහේ හක්තියෙන් දහඩිය වගුරුවා, ධාර්මිකව උපයන ධනය සතර ආකාරයකින් පරිභෝජනය කළ යුතු බව පහදමින් බුදුරජාණන් වහන්සේ විසින් අනේපිඬු සිටුතුමාට දේශනා කළ සූත්‍ර ධර්මය,
(1) ව්‍යග්ඝපජ්ජ නම් වේ. (2) පත්තකම්ම නම් වේ.
(3) අනණ නම් වේ. (4) සිඟාලෝවාද නම් වේ.

21. දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ, මෙලොව දියුණුවට ඉවහල් වන කරුණු අතර අය වැය ගැන සැලකිලිමත්ව ධනය පරිහරණය කිරීම,
(1) උට්ඨාන සම්පදා නම් වේ. (2) ආරක්ඛ සම්පදා නම් වේ.
(3) කල්‍යාණ මිත්තතා නම් වේ. (4) සමජීවිකතා නම් වේ.

22. පාලකයකු විසින් රටවැසියාගේ යහපත පදහා තම කාලය, ශ්‍රමය, ධනය, සුව පහසුව කැප කරන්නේ නම්, එය දස රාජධර්මවල අඳුන්වන්නේ,
(1) දානය ලෙසිනි. (2) සීලය ලෙසිනි. (3) පරිත්‍යාගය ලෙසිනි. (4) ඍජුබව ලෙසිනි.

23. සිදොරින් සිදු කරන දස අකුසල කර්ම අතර මනෝ කර්ම ගණයට අයත් නොවන කරුණක් වන්නේ පහත කවරක් ද?
(1) අදත්තාදානය (2) අභිධ්‍යාව (3) ව්‍යාපාදය (4) මිත්‍යාදෘෂ්ටිය

24. දිට්ඨධම්මවේදනීය කර්ම නමින් හැඳින්වෙන්නේ,
(1) මෙලොව දී ම විපාක දෙන කර්මයි. (2) දෙවන භවයේ දී විපාක දෙන කර්මයි.
(3) කවර හෝ භවයක දී විපාක දෙන කර්මයි. (4) විපාක නොදී අහෝසි වී යන කර්මයි.

25. විපාක දෙන ආකාරය අනුව යමෙකු ජීවිත පුරුද්දක් ලෙස නිතර නිතර සිදුකරන කර්ම හා කලින් කරන ලදුව නිතර සිහිකරන කුසලාකුසල චේතනා,
(1) ගරුක කර්ම නම් වේ. (2) ආසන්න කර්ම නම් වේ.
(3) ආචිණ්ණ කර්ම නම් වේ. (4) කටත්තා කර්ම නම් වේ.

26. බුදුරජාණන් වහන්සේ අනුදත් සිරිත් විරිත් සමූහයක් 'සේඛියා' නමින් හැඳින්වේ. එම සේඛියාවල සඳහන් වන පරිදි ආහාර ගැනීමේ දී නොකළ යුතු දෙයක් වන්නේ පහත කවරක් ද?
(1) ආහාර ළං කිරීමට කලින් ම මුඛය විවෘත නොකිරීම
(2) සුරු සුරු හඬ නගමින් ආහාර නොගැනීම
(3) අත ලෙවකමින් ආහාර නොගැනීම
(4) ඉදුල් අසින් පැන් බඳුන ගැනීම

27. බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට දේශනා කළ පරිදි ද්වේෂයෙන් තොරව කටයුතු කරන තැනැත්තා,
(1) දීර්ඝායුෂ ඇතිව උපදී. (2) නිරෝගීව උපදී.
(3) රූමත්ව උපදී. (4) යසස් ඇතිව උපදී.

28. බුද්ධාදී ත්‍රිවිධ රත්නයෙහි ගුණ අවබෝධ කොටගෙන ඇතිවන ප්‍රසාදය හෙවත් පැහැදීම බුදුදහමේ හැඳින්වෙන්නේ,
(1) අමූලිකා සද්ධා නමිනි. (2) ආකාරවති සද්ධා නමිනි.
(3) ආගමික භක්තිය නමිනි. (4) බුද්ධාලම්බනය නමිනි.

29. "අනවජ්ජානි කම්මානි" යන්නෙන් අවධාරණය වන්නේ මින් කවරක් ද?
(1) නිවැරදි රැකියා (2) පහත් රැකියා (3) අකුසල කර්ම (4) කුසල කර්ම

Scanned with CamScanner

30. පුද්ගලයාගේ දියුණුවට හා පරිහානියට ඉවහල් වන කරුණු පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍රධර්ම දෙක මොනවා ද?
(1) මහාමංගල සූත්‍රය හා පරාභව සූත්‍රය
(2) ධම්මික සූත්‍රය හා අනණ සූත්‍රය
(3) වසල සූත්‍රය හා පරාභව සූත්‍රය
(4) සිගාලෝවාද සූත්‍රය හා කරණීයමෙත්ත සූත්‍රය

31. දෙවියකු විසින් පුද්ගලයාගේ පිරිහීමට හේතු වන කරුණු කවරේ දැ'යි විමසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ කරුණුවලට අයත් **නොවන** කරුණක් වන්නේ,
(1) ධර්මයට අකමැති වීමයි.
(2) නුවණැත්තන් ඇසුරු කිරීමයි.
(3) මහලු වියට පත් දෙමව්පියන්ට නොසැලකීමයි.
(4) මහණ බමුණන් බොරුවෙන් රැවටීමයි.

32. මහනුවර යුගය වන විට පරිහානියට පත්ව තිබූ සම්බුද්ධ ශාසනය නැවත නගා සිටුවීම සඳහා කටයුතු කළ යතිවරයාණන් වහන්සේ,
(1) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සඟරජ හිමිපාණෝ ය.
(2) වාරියපොල ශ්‍රී සුමංගල හිමිපාණෝ ය.
(3) මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමිපාණෝ ය.
(4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය.

33. කෝට්ටේ යුගයේ විසූ විදාගම මෛත්‍රේය නාහිමිපාණන් විසින් ලියූ සැදැහැ ගුණ වඩන අගනා කාව්‍ය ග්‍රන්ථය,
(1) ලෝවැඩ සඟරාවයි.
(2) බුදුගුණ අලංකාරයයි.
(3) කාව්‍යශේඛරයයි.
(4) යසෝදරාවතයි.

34. බුදු දහම ස්ථාපිත වීමත් සමග ලංකාවේ ඉදිකළ මුල් ම ස්තූපය වන්නේ,
(1) ගිරිහඬු චෛත්‍යයයි.
(2) මහියංගන චෛත්‍යයයි.
(3) ථූපාරාම චෛත්‍යයයි.
(4) කැලණිය චෛත්‍යයයි.

35. දෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණක් වන්නේ,
(1) වජ්ජිපුත්තක භික්ෂූන් සම්මත කරගත් දස වස්තුව ප්‍රතික්ෂේප වීම ය.
(2) දස වස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූන් සසුනින් ඉවත් කිරීම ය.
(3) නිර්මල ධර්මය හා විනය ගරු කළ භික්ෂූ පරපුර ථෙරවාදී වශයෙන් සංවිධානය වීම ය.
(4) ධර්ම විනය සුරක්ෂිත කිරීම සඳහා භාණක පරපුරක් භික්ෂූන් අතර බිහි වීම ය.

36. මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලැබූ දායාද ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) භික්ෂු සමාජය ආරම්භ වීමයි.
(2) අක්ෂරමාලාවක් ලැබීමයි.
(3) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලැබීමයි.
(4) ශ්‍රී දළදා වහන්සේ ලැබීමයි.

37. ඔත් පිළිම වැඩහිඳින ඉපැරණි පූජනීය ස්ථාන දෙකකට නිදසුන් ලෙස දැක්විය හැක්කේ,
(1) තන්තිරිමලේ හා පොළොන්නරුවේ ගල්විහාරය ය.
(2) අවුකන හා තන්තිරිමලේ ය.
(3) තිවංක පිළිම ගෙය හා මාලිගාවිල ය.
(4) පොළොන්නරුවේ ගල්විහාරය හා බුදුරුවගල ය.

38. දණහිස් නමා පතුල් උඩු අතට සිටින සේ වම් පතුල දකුණු කලවා මත ද දකුණු පතුල වම් කලවා මත ද තබාගෙන හිඳගෙන සිටින බුද්ධ ප්‍රතිමා ඉරියව්ව හඳුන්වනු ලබන්නේ,
(1) බුද්ධාසන නමිනි. (2) පද්මාසන නමිනි. (3) භද්‍රාසන නමිනි. (4) වීරාසන නමිනි.

39. තම නිවසට පැමිණෙන ආගන්තුකයින්ට සැලකීම දහමේ හැඳින්වෙන්නේ,
(1) ඥාති බලි නමිනි.
(2) රාජ බලි නමිනි.
(3) දේවතා බලි නමිනි.
(4) අතිථී බලි නමිනි.

40. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ පාලකයා වූයේ,
(1) මහසෙන් රජතුමා ය.
(2) කිත්සිරිමෙවන් රජතුමා ය.
(3) පළමුවන විජයබාහු රජතුමා ය.
(4) පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය.

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2016

க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2016

විෂය අංකය
பாட இலக்கம் 11

විෂය
பாடம் බුද්ධ ධර්මය (නව නිර්දේශය)

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	4	11.	4	21.	4	31.	2
02.	2	12.	4	22.	3	32.	1
03.	1	13.	3	23.	1	33.	2
04.	3	14.	1	24.	1	34.	3
05.	1	15.	1	25.	3	35.	4
06.	2	16.	3	26.	4	36.	4
07.	3	17.	4	27.	3	37.	1
08.	4	18.	4	28.	2	38.	2
09.	2	19.	3	29.	1	39.	4
10.	1	20.	2	30.	1	40.	2

විශේෂ උපදෙස්
விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු ඔබින්
ஒரு சரியான விடைக்கு 01 புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව
சரியான விடைகளின் தொகை 25/40

I පත්‍රයේ මුළු ලකුණු
பத்திரம் I இன் மொத்தப்புள்ளி 25/40

Scanned with CamScanner

II වන පත්‍රය

1. (i) සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?

(ii) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** මොනවා ද?

(iii) බුද්ධ වචනයට අනුව රෝග දෙආකාරයකි. ඒ මොනවා ද?

(iv) පූජාවලිය හා සද්ධර්ම රත්නාවලිය යන ධර්ම ග්‍රන්ථ රචනා කළ කතුවරුන්ගේ නම් ලියන්න.

(v) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට වන 'තාදි ගුණය' යනු කුමක් ද?

(vi) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(vii) "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි." මෙම පාඨයේ තේරුම ලියන්න.

(viii) "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ
තේසං ච යෝ නිරෝධෝ - එවං වාදී මහාසමණෝ"
මෙම ගාථාවෙන් හෙළි කෙරෙන බුදු දහමේ ඉගැන්වෙන ධර්ම කරුණ කුමක් ද?

(ix) 'පුස්තකාරූඪ සංගීතිය' එනමින් හැඳින්වෙන්නේ කුමක් නිසා ද?

(x) අනුරාධපුර යුගයේ නිර්මාණය කරන ලද 'සදකඩපහණෙ'හි දැකිය හැකි සත්ත්ව රූප **හතර** නම් කරන්න.

(i) සර්ව මිත්‍ර නම් බමුණු පඬිවරයා/විශ්ව මිත්‍ර බමුණා

(ii) සමථ භාවනාව/සමාධි භාවනාව/චිත්ත භාවනාව
විපස්සනා භාවනාව/විදර්ශනා භාවනාව/ප්‍රඥා භාවනාව/ත්‍රි ලක්ෂණ භාවනාව

(iii)
- කායික රෝග
- චේතයික රෝග/මානසික රෝග

(iv) බුද්ධ පුත්‍ර හිමි/(මයුරපාද පිරිවෙන්පති හිමි)/ධර්මසේන හිමි

(v) අටලෝ දහමින් කම්පා නොවී සිටීමයි/අකම්පිත ගුණයයි

(vi)
- දානය
- ප්‍රිය වචනය
- අර්ථචර්යාව
- සමානාත්මතාව

(vii) මහණෙනි මම චේතනාව කර්මය යයි වදාරමි. / චේතනාව කර්මය වේ.

(viii) පටිච්ච සමුප්පාදය/හේතුඵල වාදය/හේතුඵල ධර්මය

(ix) ථෙරවාදී බුදු දහම පළමු වරට පුස්කොළ පොත්වල ලියවුනු නිසාය./ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ නිසාය.

(x) ඇත්, අස්, සිහ, ගව යන සතුන් සිව්දෙනායි/අශ්වයා, හස්තියා, සිංහයා, ගවයා යන සතුන් සිව් දෙනායි

එක් කොටසකට ලකුණු දෙක බැගින් 20 යි

Scanned with CamScanner

2. (i) **දස පාරමිතා අතුරෙන් දෙකක් නම් කරන්න.**

(ii) **ඔබ ඉහත (i)හි සඳහන් කළ එක් පාරමිතාවක් නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.**

(iii) **යහපත් දැහැමි සමාජයක් ගොඩනැඟීමට පාරමිතාවල ඇතුළත් ගුණධර්ම ඉවහල් වන අයුරු විස්තර කරන්න.**

(i) පාරමිතා ධර්ම දහයකි

01. දාන පාරමිතාව (දාන පාරමිතාව)
02. ශීල පාරමිතාව (සීල පාරමිතාව)
03. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව (නෙක්ඛම්ම පාරමිතාව)
04. ප්‍රඥා පාරමිතාව (පඤ්ඤා පාරමිතාව)
05. වීරිය පාරමිතාව (විරිය පාරමිතාව)
06. ක්ෂාන්ති පාරමිතාව (ඛන්ති පාරමිතාව)
07. සත්‍ය පාරමිතාව (සච්ච පාරමිතාව)
08. අධිෂ්ඨාන පාරමිතාව (අධිට්ඨාන පාරමිතාව)
09. මෛත්‍රී පාරමිතාව (මෙත්තා පාරමිතාව)
10. උපේක්ෂා පාරමිතාව (උපෙක්ඛා පාරමිතාව)

මෙම පාරමිතා ධර්ම අතුරින් දෙකක් නම්කර තිබේ නම් ලකුණු දෙකක් ලබා දෙන්න.

ලකුණු 02 යි

(ii) දාන - තමන් සතු දෙයක් අන් අයට පරිත්‍යාග කිරීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා හා ප්‍රඥාවෙන් යුතුව දෙන දානයයි. වෙස්සන්තර, සිවි, සස ජාතක කථා නිදසුන් ය .

සීල - සීල යනු ප්‍රාණඝාතාදි අකුසල වලින් වැලකී කය වචන සංවර කර ගැනීමයි. මෙය පාරමිතාවක් වන්නේ තෘෂ්ණා මාන ආදියෙන් තොරව නිවන් අපේක්ෂාවෙන් සම්පූර්ණ කරන බැවිනි.

සීල විමංස ජාතක කතාව නිදසුන්ය.

නෙක්ඛම්ම - පස්කම් සැප හැර දමා, ගිහි ගෙයින් නික්මයාම නෙක්ඛම්ම නම් වේ.

මඛාදේව ජාතකය නිදසුන් ය.

පඤ්ඤා - නිර්වාණ අපේක්ෂාවෙන් පඤ්චස්කන්ධය යථා තත්වයෙන් දැකීමයි. එසේම ලෞකික ජීවිතයේ දී ද නුවණ මෙහෙයවා කටයුතු කිරීමයි.

උම්මග්ග ජාතකය නිදසුන්ය.

වීර්ය - තමන්ගේත් අන් අයගේත් අභිවෘද්ධිය සඳහා ගන්නා නොපසුබට උත්සාහයයි.

වණ්ණුපථ ජාතකය නිදසුන්ය.

ඛන්ති - කරුණා හා උපාය දන්නා නුවණින් යුතු ඉවසීමේ ගුණයයි.

ශාන්තිවාදී ජාතකය නිදසුන් ය.

සත්‍ය - කරුණාවෙන් හා උපාය කුසලතාවෙන් යුතුව මුසාවාදයෙන් වැලකීමත්, සත්‍යයෙහි පිහිටීමත් සත්‍ය පාරමිතාව වේ.

වට්ටක ජාතකය නිදසුන් ය .

Scanned with CamScanner

අධිට්ඨාන - කරුණාවෙන් හා උපාය කුසලතාවෙන් යුතුව ස්ථිරව ම සිතා ගෙන එය කඩ නොකොට අධිෂ්ඨාන ශක්තියෙන් යුතුව කටයුතු කිරීමයි.

තේමිය ජාතකය නිදසුන් ය.

මෙත්තා - මෛත්‍රීය නම් ඔවු නොවුන් කෙරෙහි මිත්‍රශීලී බව හෝ සුහද බවයි. සියලු සතුන් කෙරෙහි සමසිත් පැතිරවීමයි.

මහාකපි, මඝමානවක ජාතක කතා නිදසුන් ය.

උපේක්ඛා - හිතවත්, අහිතවත් සියල්ලන් කෙරෙහි ඇලීම්, ගැටීම් දෙකෙන් තොරව සමීපව පැවැත්මයි. එනම් මධ්‍යස්ථ බවයි.

ලෝමහංස ජාතකය නිදසුන් ය.

කෙටි පැහැදිලි කිරීමක් තිබේ නම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.

ලකුණු 03 යි

(iii) බුද්ධත්වය ප්‍රාර්ථනා කරන උතුමන් විසින් පූරණය කරනු ලබන ගුණ සමුදාය දස පාරමිතා නමින් හැඳින්වේ.

දාන, සීල, නෙක්ඛම්ම, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා යන මෙම ගුණ ධර්ම පුහුණු කිරීමෙන් බුදු, පසේ බුදු, මහරහත් තත්වයන්ට පත්වීමට ඉවහල් වන්නාක් මෙන් ම පුද්ගල ජීවිතය සාර්ථක කර ගනිමින් දැහැමි සමාජයක් බිහි කිරීමට ද ඉවහල් වේ.

ලෝභ, ද්වේශ, මෝහයෙන් තොරව දන් දීමෙන් අයහපත් සිතුවිලි වලින් තොරව මෛත්‍රී සිතුවිලි ඇති කර ගැනීමට ඉවහල් වේ. කයින් වචනයෙන් සිදුවන වැරදි ක්‍රියාවෙන් වැලකී සිල්වත් වීමෙන් පුද්ගල ජීවිත සැපවත් වේ. දැහැමි සමාජයක් බිහි වේ.

මේ අයුරින් දස පාරමිතා ගුණ ධර්ම පුහුණු කිරීම දැහැමි සමාජයක අඩිතාලම සකස් කර ගැනීමට මඟ පෙන්වන බව පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.

ලකුණු 05 යි

3. (i) **'සුකරානි අසාධූනි' ගාථාව සම්පූර්ණ කොට ලියන්න.**

(ii) **ඉහත (i)හි සඳහන් ගාථාවේ තේරුම ලියන්න.**

(iii) **ජීවිතයක් සාර්ථක කර ගැනීමට බුදුරජාණන් වහන්සේගේ මෙම දේශනාව කෙතෙක් දුරට අදාළ වේ දැ'යි විමසන්න.**

(i) සුකරානි අසාධූනි
අත්තනෝ අහිතානි ච
යං වේ හිතං ච සාධුංච
තං වේ පරම දුක්කරං

ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න. අක්ෂර වින්‍යාසය නොසලකන්න.

ලකුණු 02 යි

Scanned with CamScanner

(ii) තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසුය.

ධම්මපද ගාථාවේ මූලික අදහස ඇතුළත් පිළිතුරකට ලකුණු තුන ලබා දෙන්න.

ලකුණු 03 යි.

(iii) සත්වයෝ නිරතුරුවම පවට නැඹුරු වී සිටිති. තමාට අහිතකර වූ අවැඩදායක වූ අයහපත් දේ කිරීමට වැඩි කැමැත්තක් දක්වති. තමාට යහපත් ප්‍රතිඵල ලබා දෙන වැඩදායී ක්‍රියා සිදු කිරීමට අකමැතිය. අහිතවත් වැරදි ක්‍රියා සිදු කිරීම ඉතා පහසු වන අතර, හිතකර හොඳ ක්‍රියා සිදු කිරීම අපහසු වේ.

මේ ගාථාවෙන් ලබාදෙන උපදේශය පුද්ගල ජීවිතයට ඉතා වැදගත්ය. වැරදි ක්‍රියාවන් හි නිරත වීමට පුද්ගල සිතේ වැඩි නැඹුරුවක් වැඩි කැමැත්තක් ඇති බවත් එය මැඩ පවත්වා යහපත් ක්‍රියාවන් හි නිරත විය යුතු බවත්, එය මැඩ පවත්වා යහපත් ක්‍රියාවන් හි නිරත විය යුතු බව මෙම ගාථාවෙන් අවධාරණය කෙරේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න.

ලකුණු 05 යි.

4. (i) චතුරාර්ය සත්‍ය අතරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) චතුරාර්ය සත්‍ය, ආර්ය සත්‍ය, ලෙස හඳුන්වන්නේ ඇයි දැයි පහදන්න.

(iii) ලෞකික ජීවිතයේ අප මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමේ මාර්ගයක් ලෙස චතුරාර්ය සත්‍ය අදාළ කරගත හැකි ආකාරය පහදන්න.

(i) චතුරාර්ය සත්‍ය

01. දුක්ඛ ආර්ය සත්‍යය (දුක)
02. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය (දුක හටගැනීමට හේතුව)
03. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (දුක නැති කිරීම)
04. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය (දුක නැති කිරීමේ මඟ)

දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යනුවෙන් ලියා තිබුන ද ලකුණු දෙන්න. කරුණු දෙකක් ලියා තිබේ නම් ලකුණු දෙකයි.

ලකුණු 02 යි

(ii) චතුරාර්ය සත්‍යය ආර්ය සත්‍ය ලෙස හැඳින්වේ. ශ්‍රේෂ්ඨ උතුම් සත්‍ය යනු එහි අදහසයි. රාග, දෝෂ, මෝහ ආදී සියලු කෙලෙස් මුලිනුපුටා දමා ආර්ය භාවයට පත්කරන නිසා මේ ධර්ම ආර්ය සත්‍ය ලෙස හැඳින්වේ. එසේම බුද්ධාදී උතුමන් විසින් අවබෝධ කරනු ලැබූ සත්‍ය ධර්ම නිසාද ආර්ය සත්‍ය ලෙස හඳුන්වනු ලැබේ.

මේ අදහස් ඇතුළත් පිළිතුරට සම්පූර්ණ ලකුණු දෙන්න .

ලකුණු 03 යි

(iii) පුද්ගලයකුගේ ලෞකික ජීවිතයට සෘජුව අදාළ කරගත හැකි ධර්මතාවක් ලෙස චතුරාර්ය සත්‍ය හැඳින්විය හැකිය.

අප ජීවත්වන කාලයේ මුහුණ දෙන ගැටලු විමසීම, විසඳා ගැනීම සඳහා මෙය උදව්කරගත හැකිය.

Scanned with CamScanner

ගැටලුවක් වේද, ඒ ගැටලුව කවර කරුණක් නිසා හටගත්තේ ද යන්න විමසීම ඉතා අවශ්‍යය. ගැටලුවට හේතුව සඳහාගත් කල්හි එය නැති කරනු සඳහා ගනු ලබන උත්සාහය මත එහින් ජයගත හැකි බව වැටහේ. එම ජයග්‍රහණය සඳහා උත්සාහවත් වීමේ දී අනුගමනය කළ යුතු, සෙවිය යුතු මාර්ගයෝ හැසිරිය යුතුවේ. එවිට ඒ අනුකාරයෙන් ගැටලුව විසඳාගත හැකිය.

මිනිසාට දුක පමණක් නොව, සැප ඇසා ද, ගැටලුවලට මුහුණ පෑමට සිදුවේ. එබඳු අවස්ථාවන් සඳහා ද බ්‍රහැරදී විසඳුම් වෙතුවෙන් චතුරාර්ය සත්‍ය අදාළ කරගත හැකිය.

දුප්පත්කම, ලෙඩ රෝග, සමාජ ගැටලු විසඳා ගැනීම් සඳහා චතුරාර්ය සත්‍ය අනුමගනය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකිය.

පිටිතුර සම්ස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.

ලකුණු 05 යි

5. (i) පළමු ධර්ම සංගීතියට බලපෑ සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය ලියන්න.

(ii) පළමු ධර්ම සංගීතිය පැවැත් වූ ස්ථානය, ඒ සඳහා අනුග්‍රහය දැක් වූ රජු හා එයට මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ නම් කරන්න.

(iii) ධර්මය හා විනය සුරක්ෂිත කර ගැනීමට පළමු ධර්ම සංගීතියෙන් ගත් විධිමත් ක්‍රියා මාර්ග කවරේ දැ'යි විස්තර කරන්න.

(i) පළමු ධර්ම සංගීතියට බලපෑ සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය

"ඇවැත්නි, නොහඬව්. නොවැලපෙව් අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුණෙමු."

මෙම ප්‍රකාශය ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.
(පාලි පාඨය ලියා තිබුන ද ලකුණු දෙන්න)

ලකුණු 02 යි

(ii) **පළමු ධර්ම සංගීතිය**

පැවැත්වූ ස්ථානය : රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණි ගුහා ද්වාරය අභියස (කොටසක් ලියා තිබුන ද ලකුණු දෙන්න)

අනුග්‍රහය දැක්වූ රජු : අජාසත්ත රජු/අජාසත් රජු

මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

එක් කරුණකට එක බැගින් ලකුණු තුනක් දෙන්න.

ලකුණු 03 යි

(iii) ධර්මය හා විනය සුරක්ෂිත කර ගැනීමට පළමු ධර්ම සංගායනාවෙන් පසු විධිමත් ක්‍රියාමාර්ග රැසක් ගැනුණි.

01. විසුරුණ මල් ගොඩක් මෙන් අසංවිධානාත්මකව පැවති **පෘතග්ජන** ධර්මය හා විනය එක්රැස්කර සම්මුතියකට ගෙන ඒම.

02. සසුනේ සුරක්ෂිත බව අරමුණු කොට ධර්මය හා විනය කොටස්වලට බෙදා එම කොටස් මුඛ පරම්පරාගතව ඉදිරියට රැකගෙන ඒමට භාණක පරම්පරාවලට භාර කිරීම

03. බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කළ විනය නීති රීති වෙනස් නොකොට ආරක්ෂා කිරීමට ප්‍රතිඥා දීම.

Scanned with CamScanner

04. සුභද්‍ර වැනි දුර්මතධාරී භික්ෂූන්ගෙන් සසුනට සිදුවිය හැකිව තිබූ විනාශය වලක්වා ගැනීමට හැකිවීම.

මේ ආදී කරුණු අතුරින් කරුණු දෙකක්වත් ඇසුරින් ගොනු කළ පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න.

ලකුණු 05 යි

6. (i) ගර්භයේ හැඩය අනුව ස්තූප ප්‍රධාන වශයෙන් ආකාර හයකට බෙදා දැක්වේ. **ඉන් ආකාර දෙකක් ලියන්න.**

(ii) ස්තූපයක රූප සටහනක් ඇඳ, එහි කොටස් නම් කරන්න.

(iii) **ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ කලා කුසලතාව ඇගයීමට ලක් කරන්න.**


(i) ගර්භයේ ස්වරූපය අනුව ස්තූප ආකාර හයකට බෙදා දැක්වේ.

01. ඛණ්ඩාකාර - ගණ්ඩාරයක (සීනුවක) හැඩය ඇති
02. ඝටාකාර - කළයක හැඩය ඇති
03. බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය ඇති
04. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
05. පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය ඇති
06. ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති

දෙකක් නම්කර ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.

ලකුණු 02 යි

(ii) **ස්තූපයක කොටස්**



රූප සටහන ඇඳ කොටස් තුනක් නම්කර තිබේනම් ලකුණු තුනක් දෙන්න. රූප සටහන පමණක් ඇඳ තිබේනම් හෝ නම් කිරීම පමණක් තිබේනම් ලකුණු දෙකක් දෙන්න.

ලකුණු 03 යි

(iii) ශ්‍රී ලංකේය සංස්කෘතියේ ප්‍රෞඩත්වය විදහාපාන කලා ශිල්ප අපේ කලාශිල්පීන්ගේ විශිෂ්ට නිර්මාණයන් බව පෙන්වා දිය හැකිය. ඒ අතර, වාස්තු විද්‍යාත්මක නිර්මාණ වූ ස්තූප, බුද්ධ ප්‍රතිමා, චිත්‍ර මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ දෙස් විදෙස් සැමගේ ඇගයීමට ලක්වන සුවිශේෂ නිර්මාණ බව පෙන්වාදිය හැකිය.

Scanned with CamScanner

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

පිළිතුරු සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.

(ලකුණු 05 යි)

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

(ii) අනෙක් ධූරය

(iii) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

(iv) දුම්බරගමනය

(i) **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා**

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා 1864 සැප්තැම්බර් මස 17 වන දින උපත ලැබීය. කුඩා කළ ඉංග්‍රීසි මිශනාරි පාසල්වල ක්‍රිස්තියානි ආගම සහිත ඉංග්‍රීසි අධ්‍යාපනය හැදෑරූ හේතුමා දෙමාපියන්ගේ මග පෙන්වීමට අනුව යමින් බෞද්ධ භික්ෂූන්ගේ ඇසුර ලබා බුදු දහම පිළිබඳ මනා දැනුමක් ලබාගත්තේය. මේ අතර, ලංකාවට පැමිණි හෙන්රිස්ටීල් ඕල්කට්තුමාගේ හා බ්ලැවැට්ස්කි මැතිනියගේ ඇසුර ලබමින් රට පුරා යමින් බෞද්ධ ප්‍රබෝධය හා ජාතික අභිමානය ඉස්මතුවන අයුරින් දේශනා කළේය.

තම ඉංග්‍රීසි නාමය වූ ඩොන් ඩෙවිඩ් නම අතහැර ධර්මපාල යන නාමය ලබා ගත්තේය. සරසවි සඳරැස් පුවත්පත ඇරඹීමට හා පරම විඥානාර්ථ බෞද්ධ සමාගම ඇරඹීමට මූලික වී ක්‍රියාකළේය. දඹදිවට ගොස් බුද්ධගයාව බෞද්ධයන්ට ලබා ගැනීමට කටයුතු කිරීම එතුමා කළ විශිෂ්ට සේවාවකි. මහබෝධි සමාගම අරම්භ කිරීම, මූලගන්ධකුටි විහාරය ආරම්භ කිරීම ආදිය මෙතුමාගෙන් සිදුවූ විශිෂ්ට සේවාවන් ය. 1931 දී සිරිදේවමිත්ත නමින් පැවිදිව 1933 ජනවාරි 16 උපසම්පදාව ලබා 1933 අප්‍රේල් 29 දින අපවත්විය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

ලකුණු 05 යි

Scanned with CamScanner

(ii) **අනණ සුබය**

අනණ සුත්‍රයේ සඳහන් පරිදි පුද්ගලයකු මෙලොව ජීවිතයේ ලැබිය හැකි සැප හතරෙන් එකකි.

අනණ සුබය යනු තමා කිසිදු අයෙකුට කිසිම ආකාරයකින් ණයක් නැතැයි සිතා ලබන සතුටයි. එනම් ණය නොවී තම ආර්ථිකය ගොඩනගා ගැනීමයි. අයවැය පිළිබඳව සැලකිලිමත් නොවීම පුද්ගලයා ණය වීමට, දුකට පත්වීමට හේතුවක් වන බවත් එසේ නොවී කටයුතු කිරීම සතුටින් ජීවත් වීම සඳහාත් ඉවහල් වන බව කිව හැකිය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

ලකුණු 05 යි

(iii) **පන්සිය පනස් ජාතක පොත් වහන්සේ**

කුරුණෑගල සාහිත්‍ය යුගයේ දී පාලි ජාතකට්ඨ කථාව ආශ්‍රය කොටගෙන රචිත කෘතියකි. සිදුහත් බෝසතාණන් වහන්සේ පාරමිතා ධර්ම සම්පූර්ණ කරන සමයේ උපන් ආත්මභාවයන් පිළිබඳ කථා පුවත් මෙහි විස්තර වේ. කථා වස්තු 547 ක් මෙහි ඇතුළත් වේ. ධර්ම දේශනා ශෛලීය උපයෝගී කරගෙන මෙම ග්‍රන්ථය රචනා කොට ඇත.

මෙම ග්‍රන්ථය පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලෙස හැඳින්වීමෙන් ම එය මහජනතාව අතර ගෞරවාදරයට පාත්‍ර වූ අයුරු පැහැදිලිය.

මෙම ග්‍රන්ථයේ අන්තර්ගත කථා පුවත්වලින් පුද්ගලයාගේ ලෞකික හා ලෝකෝත්තර ජීවිත සාර්ථක කර ගැනීමට අවශ්‍ය ජීවිතාදර්ශ සැපයේ

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.

ලකුණු 05 යි

(iv) **දුම්න්දාගමනය**

දඹදිව බුද්ධගයාවෙහි වැඩසිටි ජයශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩමවීම දුම්න්දාගමනය යනුවෙන් හැඳින්වේ. සංඝමිත්තා මහරහත් මෙහෙණිය එහි ප්‍රමුඛත්වය ගත් අතර, දෙවන පෑතිස් මහ රජු. පුද සිරිත් සහිත පෙරහැර පවත්වා, බෝධීන් වහන්සේ පිළිගෙන මහමෙවුනාවෙහි රෝපණය කළේය. බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට හා වතපිළිවෙතට අටළොස් කුලයක පිරිසා ලක්දිවට පැමිණියහ. දුම්න්දාගමනයත් සමගම ශ්‍රී ලංකාවේ බෝධී සංස්කෘතියක් ආරම්භ විය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

ලකුණු 05 යි

Scanned with CamScanner